00136

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2022/2023
**LLU3604 – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I**
කාලය - පැය 1

---

දිනය : 2023 අගෝස්තු 20
වේලාව: ප.ව. **01.30** – ප.ව. **02.30**

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය යනු ආණ්ඩුවේ ක්‍රියාවන් හි සුජාතභාවය පාලනය කරන මූලධර්මයයි. ලිඛිත හා අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අදහස් වන්නේ, රාජ්‍යයක් තුළ ඇති පුළුල් දාර්ශනික වටිනාකම්වලට අනුගත වීමයි. එමඟින් පූර්ව සංස්ථාපිත නෛතික රීතිවලට අනුගතව නිල වශයෙන් හැසිරීම අවශ්‍ය වන 'නීත්‍යානුකූලභාවය' පිළිබඳ අදහසට වඩා ඉතා වැදගත් දෙයක් හඟවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය විසින් බලය සීමා කිරීම, බලතල බෙදීම සහ වගකිවයුතු සහ වගවියයුතු ආණ්ඩුකරණය පිළිබඳ න්‍යාය අදහස් කරයි."
– Hilaire Barnett, *Constitutional & Administrative Law* (4th edn., Cavendish Publishing: London 2002) 05 – 06.

   අදාළ නෛතික අධිකාරීන් සහ අධිකරණ තීන්දු ඇසුරෙන් ඉහත ප්‍රකාශය අගයන්න.
   **(ලකුණු 20)**

2. 1796 දී බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම, වසර 2300 කට අධික කාලයක් දිවයිනේ පැවති සිංහල රාජාණ්ඩුවේ අවසානය සටහන් කළේය. 1815 දී ඇති කරගන්නා ලද උඩරට ගිවිසුමෙන් උඩරට රජු නෙරපා හැර, ජනතාවගේ පරමාධිපත්‍යය බ්‍රිතාන්‍ය කිරීටය වෙත පවරන ලදී. එතැනින් පසුව, බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ගමනට සැලකිය යුතු ලෙස බලපා ඇත. මෙම බලපෑම 1833 සහ 1972 අතර ක්‍රියාත්මක කරන ලද තීරණාත්මක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ මාලාවෙන් පැහැදිලි වේ. බ්‍රිතාන්‍ය බලධාරීන් විසින් හඳුන්වා දුන් මෙම ප්‍රතිසංස්කරණ, රටේ උද්ගත වන අවශ්‍යතා සපුරාලීම අරමුණු කර ගෙන ඇත.

   1833 සහ 1972 අතර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද, වැදගත් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ අවම වශයෙන් දෙකක් ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.
   **(ලකුණු 20)**

**සියලුම හිමිකම් ඇවිරිණි**